# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.21 පැය 0915 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 795 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය.**

2025.04.20 වන දින දහවල් කාලයේ මීගමුව පොලිස් වසමේ මීගමුව නගරයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 23,000 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 49 ක් වන ගල්කටුව පාර, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මෙයට අදාළ ඡායාරූපයක් මේ සමඟ එවමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**